රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | **இணைந்த சேவைகள் பிரிவு** | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி / Telephone: **(94) 011- 2694560**
ෆැක්ස් / தொலைநகல் / Fax: **(94) 011- 2692254**
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: **dgcs@pubad.gov.lk**
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: **www.pubad.gov.lk**

මගේ අංකය / எனது இல / My No: R/6/2(II)/OPN/2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.06.20

## ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

විභාග කොමසාරිස් ජනරාල් විසින් 2024.02.25 දින පවත්වන ලද උක්ත තරග විභාගයේ ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් 118 දෙනෙකුගේ නාමලේඛනය මෙමඟින් ප්‍රකාශයට පත්කරනු ලබන අතර එහිදී පහත කරුණු කෙරෙහි විශේෂිතව අවධානය යොමු කරවනු ලැබේ.

1. මෙම විභාගයට පෙනී සිට එක් එක් විෂයය සඳහා ලකුණු 40% ට නොඅඩුව ලැබූ හා විභාගයේ මුළු ලකුණු ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 50%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් එකසිය දහ අට දෙනෙකුගේ (118) නාම ලේඛනය කුසලතා අනුපිළිවෙලට සකසා ඇත.

2. සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂිත මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබේ.

3. එබැවින් මෙම ප්‍රතිඵල ලේඛනයේ නම සඳහන් වීම පමණක් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ පත්වීමක් ලබා ගැනීම සඳහා වන සුදුසුකමක් නොවන බව අවධාරණය කරනු ලැබේ.

4. මෙම නිලධාරීන් සඳහා සම්මුඛ පරීක්ෂණය **2024.07.06** දින පැවැත්වෙන අතර අදාළ වේලාව පහත ලේඛනයේ පළ කර ඇත. නියමිත දින නියමිත වේලාවට සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

5. සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් ලිපි එක් එක් නිලධාරියා වෙත තැපෑලෙන් යොමු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන විට පහත සඳහන් ලියකියවිලි රැගෙන ආ යුතු ය.

   I. උප්පැන්න සහතිකය

   II. මූලික සුදුසුකම්/ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික - (උපාධි/පශ්චාත් උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික)

   III. ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු ශ්‍රී ලාංකීය රියදුරු බලපත්‍රය

IV. ඔබ භාවිතා කරන නමේ හා උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකපත්වල සඳහන් වන නමේ සුළු හෝ වෙනසක් ඇත්නම්, එම වෙනස පැහැදිලි කිරීම සඳහා විධිමත් ආකෘතියකින් යුත් දිවුරුම් ප්‍රකාශයක් අදාළ සහතිකවල නම් වෙන වෙනම සඳහන් කරමින් එම නම්වලින් සඳහන් වන්නේ එකම පුද්ගලයකු බවට ප්‍රකාශ කරමින් රු.50/-ක වලංගු මුද්දරයක් මත ඔබගේ අත්සන තබා සාමදාන විනිසුරුවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු විසින් එය සහතික කර තිබිය යුතු ය.

V. ඔබ පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත් පදිංචි සහතිකය (ඩී.එස්. 04) ආකෘතිය මගින් විය යුතු ය.

VI. ඔබ වෙත යොමු කරන සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපිය

6. https://forms.gle/qyRuY2hXmKAqai8L7 සබැඳිය වෙත ගොස් ඔබගේ තොරතුරු **2024.06.28 දිනට පෙර** ලබා දීමට අයදුම්කරුවන් විසින් කටයුතු කළ යුතු වේ.

7. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණ මත මෙම බඳවා ගැනීම් කටයුතු සිදුකරන බව සැලකුව මැනවි.

එස්. ආලෝකබණ්ඩාර

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්